# සමාජ සේවා දෙපාර්තමේන්තුව
# சமூக சேவைகள் திணைக்களம்
# DEPARTMENT OF SOCIAL SERVICES

# කාර්ය සාධන වාර්තාව
# செயற்பாட்டு அறிக்கை
# Performance Report

# 2017


2 වන මහල, අදියර II, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
2 வது மாடி, கட்டம் II, செத்சிறிபாய, பத்தரமுல்ல.
2nd Floor, Stage II, Sethsiripaya, Battharamulla.

# කාර්ය සාධන වාර්තාව - 2017


**සමාජ සේවා දෙපාර්තමේන්තුව**
**දෙවන මහල,**
**අදියර II, සෙත්සිරිපාය,**
**බත්තරමුල්ල.**

| | |
|---|---|
| **දුරකථන** | **- 0112187050** |
| **ෆැක්ස්** | **- 0112186276** |
| **ඊ - මේල්** | **- dirss@sltnet.lk** |
| | **- dirssdss@gmail.com** |
| **වෙබ් අඩවිය** | **- www.socialservices.gov.lk** |

# පටුන

පිටුව


- හැඳින්වීම - සමාජ සේවා අධ්‍යක්ෂකගේ පණිවුඩය........................................ 03
- සමාජ සේවා දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු, ක්‍රියාකාරකම්, ඉලක්ක කණ්ඩායම් ........................................................................ 05
- කාර්ය මණ්ඩලය හා සංවිධාන ව්‍යුහය ........................................................ 08
- 1 වන පරිච්ඡේදය - මූලා‍ය ප්‍රගතිය ........................................................ 11
- 2 වන පරිච්ඡේදය - ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන සුභසාධන වැඩසටහන ... 18
  - ආබාධ සහිත තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීම, වෘත්තීය පුහුණුව ලබාදීම හා සමාජගත කිරීම ................................................ 18
  - ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයේ - ළමා මාර්ගෝපදේශ වැඩසටහන .................... 22
  - දෙමාපියන් සහ භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා පිරිමි ළමුන් සඳහා රැකවරණවරය ලබා දීම........................................................................ 24
  - ජාතික ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන ................................................ 24
  - දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල ................................................ 26
- 3 වන පරිච්ඡේදය - මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීම ........................................................................ 29
- 4 වන පරිච්ඡේදය - නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්, පුහුණු පාඨමාලා, වැඩමුළු හා සම්මන්ත්‍රණ පැවැත්වීම ................................................ 31
- 5 වන පරිච්ඡේදය විශේෂ වැඩසටහන් හා ජයග්‍රහණ .................................... 33

# සමාජ සේවා අධ්‍යක්ෂකගේ පණිවුඩය

ශ්‍රීමත් අයිවර් ජෙනිංන්ස් මහතාගේ සභාපතිත්වයෙන් 1944 වර්ෂයේ දී පත් කරන ලද සමාජ සේවා කොමිෂන් සභාවේ නිර්දේශයක් මත 1948 පෙබරවාරි මස 01 වන දින සමාජ සේවා දෙපාර්තමේන්තුව පිහිටුවා ඇත. ආරම්භයේ දී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වූයේ අප රට තුළ ජීවත්වන වතු කම්කරුවන්, දිළිඳු පවුල් හා එම පවුල්වල සාමාජිකයින් විවිධ රෝගාබාධයන්ට ගොදුරු වන හා ආපදාවන්ට ලක්වන අවස්ථාවල දී මූල්‍යමය ආධාර සැපයීමයි. ප්‍රාථමික අවස්ථාවේ පැවැති මෙම වැඩසටහන් කාලීන අවශ්‍යතා මත යාවත්කාලීන කරමින් දෙන ලද සහනය යැපුම් මානසිකත්වයට සීමා නොකොට පුද්ගලයාගේ හෝ පවුලේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය ඇති කිරීම සඳහා පරිවර්තනය කොට ඇත.

විශේෂයෙන් ශ්‍රී ලංකාවේ අප මේ පසු කරන වත්මන් අවධිය තුළ අප රට තුළ දැන නොදැන කරන ලද මිනිස් ක්‍රියාකාරකම් හෝ පාරිසරික ගැටළු හේතු කොට ගෙන පුද්ගලයන් විවිධ ආබාධිත තත්ත්වයට පත්වීම, සාඵල්‍යතාවය අඩුවීම, බෝනොවන රෝග වර්ධනය වීම, මනෝවික්ෂිප්තභාවයට පත්වීම, සියදිවි නසාගැනීම, දිළිඳුකම හා මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම යන කාලීන සමාජ ගැටළු රාශියකට රජයට මුහුණ දීමට සිදුවී ඇත. මෙම තත්ත්වය පුද්ගලයාගේ මෙන්ම සමස්ථ සමාජයේම ප්‍රගමනයට සෘජු හෝ වක්‍රව දැඩි අහිතකර බලපෑම් සිදු කරයි.

මෙවැනි ආන්තීකරණයට හා අවාසිසහගත තත්ත්වයන්ට පත් ජන කොටස් ඉලක්ක කරගනිමින් මුහුණ දී ඇති ගැටළු පාලනය කරන අතරම ස්වෝත්සාහයෙන් නගාසිටුවමින් ජාතික සංවර්ධනයේ සක්‍රිය කොටස්කරුවන් කිරීම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම අරමුණ විය. ඒ සඳහා විවිධ පර්යේෂණ, ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා සංවර්ධන වැඩසටහන් ජාතික මට්ටමේ සිට බිම් මට්ටම දක්වා සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයන් හරහා ක්‍රියාවට නැංවීම සිදුකොට ඇත. විශේෂයෙන් දෙපාර්තමේන්තුව, ආබාධිත ප්‍රජාව ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක කරන ලද සුභසාධන වැඩසටහන්, මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම, වෘත්තීය පුහුණුව ලබා දීම, සමාජගත කිරීම හා කාලීන සමාජ ගැටළු අවම කිරීම වැනි ප්‍රධාන වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කොට ඇත. සේවා සපයන නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව, සේවා අභිප්‍රේරණය හා ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා දේශීය විදේශීය වැඩමුළු, සම්මන්ත්‍රණ හා පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම සිදුකොට ඇත.

ඉතා කෙටි කාලයක් තුළ සංවිධානය කරන ලද ආබාධ සහිත ප්‍රජාව සඳහා ජාතික මට්ටමේ වැඩසටහන් හතරක් 2017 වර්ෂයේ ඉතා සර්ථකව පැවැත්වීමට හැකිවීම ගැන අභිමාණයෙන් යුතුව මෙහි දී සඳහන් කරමි. මෙම වැඩසටහන් තුළින් අභ්‍යාසලාභීන් හා ඔවුන්ගේ දෙමාපියන් , කාර්ය මණ්ඩලය හා සෙසු සාමාජිකයින් අතර අන්නෝන්‍ය සුහදතාව , අවබෝධය හා විශ්වසනීයත්වය ඇති කිරීම අපේක්ෂා කෙරේ. විශේෂයෙන් උතුරු නැගෙනහිර ආබාධිත තරුණ තරුණියන්ගේ සුභසාධනය සඳහා කිලිනොච්චියේ සහ මඩකලපුවේ නව ඉදිකිරීම් දෙකක් සඳහා මුල්ගල් තැබීමත්, ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයක් පිහිටු වීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ කොට්ටාව නගරයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා මුල්ගල් තැබීමත් මෙම වර්ෂයේ සිදු කිරීමට හැකි විය. විශේෂයෙන් මෙම වර්ෂයේ මැදභාගයේ දිවයිනේ පැවැති අයහපත් කාලගුණික තත්ත්වය හේතුකොට ගෙන හදිසි ආපදා තත්ත්වයට පත් ජන කොටස් එම තත්ත්වයෙන් මුදවාගෙන අවශ්‍ය

සේවා ඉතා කඩිනමින් ලබා දීම සඳහා බිම්ටම්ටමේ සියලුම ක්ෂේත්‍ර නිලධාරින් මැදිව කටයුතු කර ඇත.

සමස්ථයක් වශයෙන් ගත් කල අවාසි සහගත හා පීඩාවන්ට පත් ප්‍රජාව සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තුළ ඉතා සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි වූ බව 2017 වර්ෂයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය තුළින් මනාව පැහැදිලි වේ. 2017 වර්ෂය සඳහා ඉදිරිපත් කළ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් 520,718,670ක් ලැබුණු අතර, සේවා අවශ්‍යතාවන් සපුරාගැනීම සඳහා රුපියල් 483,916,822ක් වියදම් කොට ඇත. මූලධන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් 180,305,000ක් වෙන් වූ අතර මෙම වර්ෂය තුළදී අදාළ කාර්යයන් සඳහා රුපියල් 101,667,728ක් වැය විය. එය 2017 වර්ෂයේ අපේක්ෂිත ඉලක්කවලින් 83.53% ක ප්‍රගතියකි.

දෙපාර්තමේන්තු මෙහෙවරට අනුගත වෙමින් සියලුම සංවර්ධන වැඩසටහන් සාර්ථක කරගැනීමට සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සියලුම කාර්යමණ්ඩල, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත සියලුම ක්ෂේත්‍ර නිලධාරින් කණ්ඩායම් හැඟීමෙන් දිවා රෑ නොබලා ඉතා උනන්දුවෙන් කැප වීමෙන් කටයුතු කළ බව කෘතවේදීව සිහිපත් කරමි.

වජිර කඹුරුගමුව
සමාජ සේවා අධ්‍යක්ෂ (වැ.අ.)

## දැක්ම

**"2030 වන විට ආන්තිකරණයට හා අවාසි සහගත තත්ත්වයන්ට පත් ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සමානාත්මතාවය සපිරි සුරක්ෂිත ශ්‍රී ලංකාවක් බිහිකිරීමේ පුරෝගාමියා වීම "**

## මෙහෙවර

**"ඉලක්ක ගත ප්‍රජාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම හා සවිබලගැන්වීම තුළින් සමාජ අන්තර්කරණය උදෙසා අන්තර් ආයතනික සම්බන්ධීකරණය හා වෘත්තීයවේදීමය මැදිහත්වීම මඟින් නවෝත්පාදන ප්‍රවේශයන් ඔස්සේ වේගවත්ව, කාර්යක්ෂමව හා සඵලදායීව පර්යේෂණ පැවැත්වීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීම "**

### අරමුණු

- වයස අවු.16 - 35 අතර ආබාධ සහිත තරුණ තරුණියන් 500 දෙනෙකුගේ වෘත්තීමය ක්‍රියාකාරකම් හා බාහිර ක්‍රියාකාරකම් සවිබල ගැන්වීම.
- භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති ළමුන් 80ක් සඳහා නේවාසික රැකවරණය ලබාදීම.
- වයස අවුරුදු 0 -18 අතර විවිධ ආබාධවලින් පෙළෙන ළමුන් 100 දෙනෙකුගේ ආබාධිත තත්ත්වය අවම කිරීම සඳහා කල්තියා මැදිහත්වීම.
- ආබාධ සහිත ප්‍රජාව දෛනික ජීවිතයේ දී මුහුණපාන විවිධ ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම හා බලගැන්වීම.
- සංඥා භාෂාව පිළිගැනීම හා ප්‍රවර්ධනය.
- ආබාධ සහිත තැනැත්තන්ට සේවා සපයන ස්වේච්ඡා සංවිධාන බල ගැන්වීම.
- මතට ඇබ්බැහිවූවන් 100ක් නේවාසික පුනරුත්ථාපනය කිරීම ,වෘත්තීය පුහුණුව ලබාදීම, පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීම.
- විවිධ කාලීන සමාජ ගැටළුවලට ගොදුරු වූ පුද්ගලයින් සඳහා නිවැරදි මාර්ගෝපදේශකත්වය ලබාදීම
- සේවා සපයන නිලධාරීන්ගේ දැනුම,කුසලතා හා ආකල්ප උසස් තත්ත්වයට ගෙන ඒම.

## ක්‍රියාකාරකම්

- ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම, ස්වයං රැකියා සඳහා වෘත්තීය මෙවලම් ලබාදීම හා විවෘත රැකියා සඳහා යොමු කිරීම.
- ආබාධ සහිත වූවන් සඳහා රැකියා වෙළඳපොළ හඳුනාගැනීම හා පුළුල් කිරීම.
- ආබාධ සහිත වූවන්ගේ කාලීන අවශ්‍යතා හා ප්‍රවණතා හඳුනා ගැනීමට පර්යේෂණ කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති ළමුන් සඳහා කල්තියා මැදිහත් වීම තුළින් ඔවුන් අන්තර්කරණ අධ්‍යාපනය සඳහා යොමු කිරීම.
- ශ්‍රවණාබාධිත වූවන් සඳහා හැඳුනුම්පත් ලබාදීම හා සංඥා භාෂා පරිවර්තන සේවා ලබාදීම තුළින් ශ්‍රවණාබාධිත වූවන්ගේ එදිනෙදා කටයුතු පහසු කිරීම.
- භාරකරුවන් අහිමි බුද්ධි ඌනතා ඇති පිරිමි ළමුන් සඳහා රැකවරණය සැපයීම.
- ආබාධ සහිත පුද්ගලයින්ගේ සුභසාධනය සඳහා පවත්වාගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධාන සඳහා මූල්‍යාධාර සැපයීම.
- වයස අවු. 60 අඩු දෘශ්‍යාබාධ සහිත තැනැත්තන් සඳහා අක්ෂි කාච ලබාදීම හා වෛද්‍යාධාර සැපයීම, ක්‍රීඩා, අධ්‍යාපනික හා සංස්කෘතික ආධාර ලබා දීම, ආයතන සඳහා යටිතල පහසුකම් සැපයීම හා වෙනත් සුභසාධන කටයුතු.
- ප්‍රජා මූලික අන්තර්කරණ සංවර්ධන වැඩසටහන යටතේ ආබාධ සහිත වූවන් සඳහා අවැසි සේවා ලබා දීම.
- ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.
- ඒකාබද්ධ ප්‍රවේශය හරහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම.
- පුණ්‍ය ආයතන ලියාපදිංචි තත්වය ලබා ගැනීම සඳහා නිර්දේශ ලබා දීම, ජල බිල්පත් හා විදුලි බිල්පත් සඳහා සහන ලබාදීමට නිර්දේශ කිරීම.
- සේවා සපයන නිලධාරීන්ගේ දැනුම කුසලතාවය හා ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩ මුළු සඳහා යොමු කිරීම.

## උපාය මාර්ග

i. ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීයමය ක්‍රියාකාරකම් නව තාක්ෂණික ක්‍රමවේදයන් උපයෝගී කර ගනිමින් පවතින වෙළඳ පොළට සරිලන පරිදි සංවර්ධනය කිරීම.

ii. සාර්ථකව පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන් සඳහා ස්වයං රැකියා මෙවලම් කට්ටල ලබාදීම හා පෞද්ගලික ව්‍යාපාරික ආයතනවල රැකියා අවස්ථා හඳුන්වා දීම.

iii. පවතින වෙළඳ පොළට සරිලන පරිදි වෘත්තීය පුහුණු පාඨමාලා නවීකරණය කිරීම සඳහා යටිතල පහසුකම් ඇති කිරීම.

iv. වෘත්තීය පුහුණුව සඳහා අභ්‍යාසලාභීන් වැඩි පිරිසක් ඇතුළත් කර ගැනීමට හැකිවන පරිදි සියලුම පළාත්වල වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම.

v. ආබාධිත ප්‍රජාවට දෛනිකව මුහුණ දීමට සිදුවන ගැටළු අවම කර ගැනීම සඳහා වූ ස්ව ශක්ති සංවිධාන සක්‍රිය කිරීම හා තවතවත් සංවිධාන පිහිටු වීම.

vi. සෘජු ප්‍රතිපාදන ලබාදීම ( ජල පහසුකම්, විදුලි පහසුකම් , ප්‍රවේශ පහසුකම් , කොමඩ් සැපයීම)

vii. භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති ළමුන් සඳහා පවත්වාගෙන යනු ලබන රැකවරණ මධ්‍යස්ථාන පුළුල් කිරීම සඳහා යටිතල පහසුකම් ලබාදීම හා පළාත් මට්ටමින් රැකවරණ මධ්‍යස්ථාන පිහිටු වීම.

viii. සේවා සපයන නිලධාරීන්ගේ දැනුම , කුසලතා හා ආකල්ප උසස් තත්වයට ගෙන එම සඳහා දේශීය විදේශීය වැඩමුළු, සම්මන්ත්‍රණ හා පුහුණු පාඨමාලා සඳහා යොමු කිරීම.

## ඉලක්ක කණ්ඩායම්


i. ආබාධ සහිත පුද්ගලයන්
ii. වැඩිහිටියන්
iii. තනි මාපිය පවුල්
iv. මතට ඇබ්බැහි වූවන්
v. මානසික පීඩා සහිත අය
vi. යාචකයන් ,වීථි දරුවන්
vii. වකුගඩු රෝගීන්
viii. පිළිකා, තැලසීමියා රෝගීන්
ix. ක්ෂය රෝගීන්, ලාදුරු රෝගීන්
x. බන්ධනාගාරගත වූවන්ගේ පවුල්
xi. හදිසි ආපදා තත්වයන්ට පත්වූවන්
xii. උපදේශන කටයුතු
xiii. සමාජ ආරක්ෂණ කටයුතු
xiv. අනාථ/ අත්හළ පුද්ගලයන්
xv. අයාලේ යන්නන් හා ගණිකාවන්
xvi. ස්වේච්ඡා සංවිධාන ලියාපදිංචිය
xvii. ව්‍යසනයන්ට / උවදුරුවලට ලක්වූවන්ගේ පවුල්
xviii. ජනාධිපති අරමුදලේ නිර්දේශ ඉදිරිපත් කිරීම
xix. චිරාත් කාලීන රෝග නිසා රෝහල් ගතව පීඩාවට පත්වන පුද්ගලයින් හා පවුල් සවිබලගැන්වීම
xx. මානසික රෝගීන්ගේ පසුභාර කටයුතු හා සමාජගත කිරීම
xxi. විගමනික පවුල්වල සාමාජිකයන්

## සමාජ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 2017-12-31

| තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප්තලය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1-2016 | 1 | - | 1 |
| අතිරේක අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.ප.සේ. | I | SL 1-2016 | 1 | 1 | - |
| ප්‍රධාන ගණකාධිකාරි | ශ්‍රී. ලං.ග. සේ. | I | SL 1-2016 | 1 | 1 | - |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී. ලං.ග.සේ. | I | SL 1-2016 | 1 | 1 | - |
| ගණකාධිකාරී | ශ්‍රී. ලං.ග.සේ. | II/ III | SL 1-2016 | 1 | - | 1 |
| නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලං ප. සේ. | II/ III | SL 1-2016 | 3 | 1 | 2 |
| සමාජ සුභසාධන අධිකාරී | ස.සේ.දෙ. | I /II/ III | SL 1-2016 | 2 | 2 | |
| ස්ථානභාර නිලධාරි | ස.සේ.දෙ. | I /II/ III | MN 7-2016 | 5 | - | 5 |
| පරිපාලන නිලධාරි | රා.ක.ස.සේ. සුප්‍ර | | MN 7-2016 | 1 | 1 | - |
| සමාජ සේවා නිලධාරි | ස.සේ.දෙ. | I /II/ III | MN 5-2016 | 480 *අහෝසි වීමට යටත්ව | 109 | - |
| සමාජ සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා | I /II/ III | MN 4-2016 | | 194 | - |
| සංවර්ධන නිලධාරි | ස.නි.සේ. | I /II/ III | MN 4-2016 | | 175 | - |
| දෘශ්‍යාබාධිත සංවර්ධන නිලධාරි | ස.සේ.දෙ. | I /II/ III | MN 4-2016 | 13 | 9 | 4 |
| ආධුනික භාෂා පරිවර්තක | කොන්ත්‍රාත් | | MN 4-2016 | 1 | - | 1 |
| වැඩ කළමනාකරු | ස.සේ.දෙ. | I /II/ III | MT 3-2016 | 5 | 1 | 4 |
| වෘත්තීය උපදේශක | ස.සේ.දෙ. | I /II/ III | MT 1-2016 | 59 | 38 | 21 |
| වෘත්තීය උපදේශක (කොන්ත්‍රාත් ) | - | - | - | 9 | 3 | 6 |
| තොරතුරු හා සන්නිවේදන හා තාක්ෂණ සහකාර | තො.ස.තා.ස. සේ. | I /II/ III | MT 1-2016 | 1 | 1 | - |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේ. | I /II/ III | MN 2-2016 | 46 | 39 | 7 |
| සංඥා භාෂා පරිවර්තක | ස.සේ.දෙ. | I /II/ III | MN 1-2016 | 10 | 6 | 4 |
| පෙර පාසල් ගුරු | ස.සේ.දෙ. | I /II/ III | MN 1-2016 | 3 | 3 | - |

| තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප්තලය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|
| නිවාස පාලක | ස.සේ.දෙ. | I /II/ III | MN 1-2016 | 14 | 5 | 9 |
| රියදුරු | රියදුරු.සේ. | I /II/ III | PL 3-2016 | 13 | 11 | 2 |
| අරක්කැමි | ස.සේ.දෙ. | I /II/ III | PL 2-2016 | 9 | 8 | 1 |
| ළමා සංවර්ධන සහායක | ස.සේ.දෙ. | I /II/ III | PL 1-2016 | 5 | 5 | - |
| අරක්කැමි සහායක | ස.සේ.දෙ. | I /II/ III | PL 1-2016 | 15 | 15 | - |
| උපස්ථායක | ස.සේ.දෙ. | I /II/ III | PL 1-2016 | 32 | 29 | 3 |
| කාර්යාල කාර්ය සහායක | කා.කා.සේ. | I /II/ III | PL 1-2016 | 42 | 40 | 2 |
| පුනරුත්ථාපන සහායක කොන්ත්‍රාත් | - | - | - | 9 | 8 | 1 |
| එකතුව | | | | 782 | 706 | 74 |

## සංවිධාන ව්‍යුහය
# සමාජ සේවා දෙපාර්තමේන්තුව



# 1වන පරිච්ඡේදය

මූල්‍ය ප්‍රගතිය

| | ප්‍රතිපාදන<br>රු. | වියදම<br>රු. | ප්‍රතිශතය |
|---|---|---|---|
| පුනරාවර්තන | 520,718,670 | 483,916,822 | |
| ප්‍රාග්ධන | 180,305,000 | 101,667 ,728 | |
| එකතුව | 701,023,670 | 585,584,550 | 83.53% |

වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන
ව්‍යාපෘතිය 01 - පරිපාලන හා ආයතන සේවා
පුනරාවර්තන වියදම්

| කාණ්ඩය | 2017 වර්ෂයේ ඇස්තමේන්තුව රු. | වියදම<br>රු. |
|---|---|---|
| පුද්ගල පඩිනඩි | 21,184,000 | 20,876,618 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 16,534,670 | 15,051,146 |
| මුළු පුනරාවර්තන වියදම් | 37,718,670 | 35,927,764 |

වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය 02 - සමාජ සේවාවන් සඳහා මුදල්
පුනරාවර්තන වියදම්

| කාණ්ඩය | 2017වර්ෂයේ ඇස්තමේන්තුව<br>රු. | 2017 වර්ෂයේ මුළු වියදම<br>රු. |
|---|---|---|
| පුද්ගල පඩිනඩි | 227,200,000 | 222,638,959 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 21,190,000 | 18,289,566 |
| මුළු පුනරාවර්තන වියදම | 248,390,000 | 240,928,525 |

වැඩසටහන 02 - සංවර්ධන වැඩටසහන
ව්‍යාපෘතිය 03 - පුනරුත්ථාපන හා පුහුණු කිරීම් සේවා
පුනරාවර්තන වියදම්

| කාණ්ඩය | 2017 වර්ෂයේ ඇස්තමේන්තුව<br>රු. | 2017 වර්ෂයේ මුළු වියදම<br>රු. |
|---|---|---|
| පුද්ගල පඩිනඩි | 92,000,000 | 91,261,823 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 142,610,000 | 115,798,710 |
| මුළු පුනරාවර්තන වියදම | 234,610,000 | 207,060,533 |

**2017 වර්ෂයේ අත්තිකාරම් ගිණුමේ සීමාවන්**

| | ඇස්තමේන්තු ගත සීමාවන් රු. | සත්‍ය සීමාවන් රු. |
|---|---|---|
| උපරිම වියදම් සීමාව | 20,000,000 | 19,073,549 |
| අවම ලැබීම් සීමාව | 15,000,000 | 15,174,119 |
| උපරිම හර ශේෂ සීමාව | 95,000,000 | 53,364,853 |

**2017 වර්ෂයේ ආදායම් ඒකරාශී කිරීම්**

| ආදායම් සීමාව | සීමාව රු. | වියදම් රු. |
|---|---|---|
| 2002-01-01 රජයේ ගොඩනැගිලි | 91,000 | 56,786 |
| 2002- 02- 99 පොලිය වෙනත් (ර.නි.අ.පො.) | 1,990,000 | 1,993,349 |
| (2003 - 99 -000) අනෙකුත් ලැබීම් | | 812,344 |

**ශීර්ෂය - 216 සමාජ සේවා දෙපාර්තමේන්තුව**
**01 - මෙහෙයුම් වැඩසටහන**
**01 - පරිපාලනය හා ආයතන සේවා**
**පුනරාවර්තන වියදම්**

| වැය විෂය | අයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම් රු. |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | | 21,184,000 | 20,876,617 |
| 1001 | වැටුප් හා වේතන | 12,800,000 | 12,647,154 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 884,000 | 875,412 |
| 1003 | වෙනත් දීමනා | 7,500,000 | 7,354,051 |
| ගමන් වියදම් | | 890,000 | 804,515 |
| 1101 | දේශීය | 390,000 | 304,717 |
| 1102 | විදේශීය | 500,000 | 499,798 |
| සැපයීම් | | 3,910,000 | 3,752,264 |
| 1201 | ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 2,200,000 | 2,076,569 |
| 1202 | ඉන්ධන | 1,600,000 | 1,590,247 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 110,000 | 85,448 |
| නඩත්තු වියදම් | | 1,350,000 | 872,138 |
| 1301 | වාහන | 1,200,000 | 798,086 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 150,000 | 74,052 |
| සේවා | | 6,115,000 | 5,364,404 |
| 1401 | ප්‍රවාහන | 565,000 | 534,856 |
| 1402 | තැපැල් හා සංනිවේදනය | 950,000 | 870,636 |
| 1403 | විදුලිය සහ ජලය | 2,800,000 | 2,379,811 |
| 1409 | වෙනත් | 1,800,000 | 1,579,101 |
| මාරු කිරීම් | | 4,249,670 | 4,242,824 |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | 250,000 | 243,993 |
| 1408 | කල්බදු වාහන කුලී | 3,999,670 | 3,998,831 |
| වෙනත් පුනරාවර්තන වියදම් | | 20,000 | 15,000 |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 20,000 | 15,000 |

ශීර්ෂය - 216 සමාජ සේවා දෙපාර්තමේන්තුව
02 - සංවර්ධන වැඩසටහන
02 - සමාජ සේවාවන් සඳහා මුදල් ආධාර
පුනරාවර්තන වියදම්

| වැය විෂය | අයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | | 227,200,000 | 222,638,958 |
| 1001 | වැටුප් හා වේතන | 144,500,000 | 141,509,231 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,200,000 | 649,806 |
| 1003 | වෙනත් දීමනා | 81,500,000 | 80,479,921 |
| ගමන් වියදම් | | 11,860,000 | 10,287,755 |
| 1101 | දේශීය | 11,000,000 | 9,427,756 |
| 1102 | විදේශීය | 860,000 | 859,999 |
| සැපයීම් | | 2,520,000 | 2,306,249 |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කර්යාලීය අවශ්‍යතා | 2,300,000 | 2,092,002 |
| 1202 | ඉන්ධන | 150,000 | 150,000 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 70,000 | 64,247 |
| නඩත්තු වියදම් | | 200,000 | 154,268 |
| 1301 | වාහන | 120,000 | 119,999 |
| 1302 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 80,000 | 34,269 |
| සේවා | | 2,110,000 | 1,691,920 |
| 1402 | තැපැල් සහ සංනිවේදන | 250,000 | 228,809 |
| 1409 | වෙනත් | 1,860,000 | 1463,111 |
| මාරු කිරීම් | | 4,500,000 | 3,849,373 |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලි | 4,500,000 | 3,849,373 |

ශීර්ෂය - 216 සමාජ සේවා දෙපාර්තමේන්තුව

02 - සංවර්ධන වැඩ සටහන

03 - පුනරුත්ථාපන හා පුහුණු කිරීම් සේවා

පුනරාවර්තන වියදම්

| වැය විෂය | ආයිතමය | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| පුද්ගල පඩි නඩි | | 92,000,000 | 91,261,422 |
| 1001 | වැටුප් හා වේතන | 53,400,000 | 52,788,403 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 3,300,000 | 3,236,541 |
| 1003 | වෙනත් දීමනා | 35,300,000 | 35,236,478 |
| ගමන් වියදම් | | 1,650,000 | 1,520,939 |
| 1101 | දේශීය | 1,200,000 | 1,070,947 |
| 1102 | විදේශීය | 450,000 | 449,992 |
| සැපයීම | | 32,600,000 | 30,353,509 |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අව්‍යතා | 1,200,000 | 1,199,278 |
| 1202 | ඉන්ධන | 1,500,000 | 1,153,748 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 29,800,000 | 27,901,738 |
| 1204 | වෛද්‍ය සැපයීම් | 100,000 | 98,745 |
| නඩත්තු වියදම් | | 1,800,000 | 1,371,042 |
| 1301 | වාහන | 700,000 | 606,805 |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000 | 128,874 |
| 1303 | ගොඩනැඟිලි සහ ඉදි කිරීම් | 800,000 | 635,363 |
| සේවා | | 17,260,000 | 16,397,175 |
| 1401 | ප්‍රවාහන | 260,000 | 195,203 |
| 1402 | තැපැල් සහ සංනිවේදන | 700,000 | 562,432 |
| 1403 | විදුලිය සහ ජලය | 3,200,000 | 2,606,156 |
| 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන | 100,000 | 38,760 |
| 1409 | වෙනත් | 13,000,000 | 12,994,624 |
| මාරු කිරීම් | | 1,500,000 | 1,201,446 |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | 1,500,000 | 1,201,446 |
| 1- විවිධ හැකියා සහිත පුද්ගලයන් සඳහා වෘත්තීය පුහුණු ආයතන | | 65,000,000 | 42,409,644 |
| 1501 | සුබ සාධන වැඩ සටහන් | 65,000,000 | 42,409,644 |
| 2.මත් ද්‍රව්‍යයට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය | | 2,000,000 | 1,791,938 |
| 1501 | සුබ සාධන වැඩ සහටන් | 2,000,000 | 1,791,938 |
| 3 - දෘශ්‍යාබාධිත භාර අරමුදල | | 7,000,000 | 7,000,000 |
| 1508 | වෙනත් | 7,000,000 | 7,000,000 |
| 8 - විවිධ හැකියා සහිත පුද්ගලයින්ගේ විනෝදාත්මක හා ක්‍රීඩා කටයුතු සඳහා පහසුකම් සැළසීම | | 13,800,000 | 13,753,009 |
| 1508 | වෙනත් | 13,800,000 | 13,753,009 |

**2017** වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන හා වියදම්

| ව්‍යාපෘති අංකය | වැය ශීර්ෂය | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන රු.මි. | වියදම රු.මි. |
|---|---|---|---|---|
| 01. | 2001 | ගොඩනැගිලි අලුත්වැඩියාව හා නවීකරණය | 0.035 | 0.035 |
| | 2002 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අලුත්වැඩියාව | 0.500 | 0.049 |
| | 2003 | වාහන අලුත්වැඩියාව | 1.200 | 0.529 |
| | 2102 | කාර්යාලයීය උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 1.200 | 1.171 |
| | 2103 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම | 0.500 | 0.486 |
| | 2106 | මෘදුකාංග සංවර්ධනය | 0.250 | 0.214 |
| | 2401 | පුහුණු කිරීමේ හා හැකියා වර්ධනය | 1.320 | 1.320 |
| | | උප එකතුව | 5.005 | 3.804 |
| 02. | 2401 | පුහුණු කිරීමේ හා හැකියා වර්ධනය - කාර්ය මණ්ඩලය | 2.200 | 2.200 |
| | | උප එකතුව | 2.200 | 2.200 |
| 03. | 2001 | ගොඩනැගිලි අලුත්වැඩියාව හා නවීකරණය | 2.000 | 1.918 |
| | 2002 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අලුත්වැඩියාව | 0.800 | 0.212 |
| | 2003 | වාහන අලුත් වැඩියාව | 2.000 | 1. 061 |
| | 2102 | කාර්යාලයීය උපකරණ හා ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | 3.000 | 2.991 |
| | 2103 | යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මිලදී ගැනීම. | 3.000 | 2.719 |
| | 2104 | නව ඉදිකිරීම් | 1.200 | 1.200 |
| | 2401 | පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 1.550 | 1.550 |
| | 4 - 2104 | නව ඉදිකිරීම් | 2.300 | 2.015 |
| | 5 - 2509 | ප්‍රජා මූලික පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 12.250 | 12.063 |
| | 6 - 2104 | ගොඩනැගිලි ඉදිකිරීම හා නවීකරණය | 20.000 | 14.170 |
| | 9 - 2104 | ගොඩනැගිලි ඉදිකිරිම ( ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය - කොට්ටාව) | 25.000 | 9.135 |
| | 10 - 2104 | ගොඩනැගිලි ඉදි කිරිම (වෘත්තීය පුහුණු ආයතනය - කිළිනොච්චිය) | 50.000 | 22.125 |
| | 11 - 2104 | ගොඩනැගිලි ඉදි කිරිම (වෘත්තීය පුහුණු ආයතනය - මඩකලපුව) | 50.000 | 24.736 |
| | | උප එකතුව | 173.100 | 95.895 |
| | | මුළු එකතුව | 180.305 | 101.900 |

වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය 03 - පුනරුත්ථාපනය හා පුහුණු කිරීම් සේවා
වැය ශීර්ෂය 2001 ගොඩනැගිලි අලුත් වැඩියාව හා නවීකරණය - 2017

| අනු අංකය | ආයිතම | ඇස්තමේන්තුව රු. | වියදම රු. |
|---|---|---|---|
| 01. | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. ජනෙල් වල ග්‍රිල් සවි කිරීම<br>II. නව ගොඩනැගිල්ලේ ප්‍රවේශ මාර්ගයේ ආරක්ෂිත වැටක් හා ගේට්ටුවක් සවි කිරීම | 800,000 | |
| | III. නව ගොඩනැගිල්ලේ ජනෙල්වල ස්ටිකර් ඇලවීම | 93,000 | |
| | IV. නව ගොඩනැගිල්ලේ සමරුපලකය සකස් කිරීම | 52,000 | |
| 02. | සීදූව වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. කාර්යාලයේ වැසිකිළි පද්ධතිය අළුත් වැඩියා කිරීම | 450,000 | |
| 03. | පුවක්පිටිය ජයවිරු සෙවන | | |
| | I. නව ගොඩනැල්ල හා පැරණිගොඩනැගිල්ල යාකරමින් වැසි ආවරණයක් සකස් කිරීම. | 355,320 | |
| 04. | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. පැනල් බෝර්ඩ් සවිකිරීම | 197,680 | |
| 05. | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. නව ගොඩනැගිලි සමරු පලකය සකස් කිරීම | 52,000 | 1,917,555 |

වැඩසටහන - 02 - සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය - 03 - පුනරුත්ථාපන හා පුහුණු කිරීම් සේවා
වැය ශීර්ෂය - 2104 - ගොඩනැගිලි ඉදිකිරීම් - 2017

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|
| 01. | අධිකාරි නිල නිවස - වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය | 1,200,000 | 1.200,000 |

වැඩසටහන - 02 - සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය - 03 - පුනරුත්ථාපන හා පුහුණු කිරීම් සේවා
වැය ශීර්ෂය - 4 -2104 - ගොඩනැගිලි ඉදිකිරීම් - 2017

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|
| 01. | පුවක්පිටිය ජයවිරු සේවන | | 2,015,049 |
| | I. මුළුතැන්ගෙය පුළුල් කිරීම | 2,015,049 | |

වැඩසටහන 02 - සංවර්ධන වැඩසටහන
ව්‍යාපෘතිය 03 - පුනරුත්ථාපනය හා පුහුණු කිරීම් සේවා
වැය ශීර්ෂය 6 – 2104 ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණය

| අනු අංකය | | වැඩසටහන | ප්‍රතිපාදන රු. | වියදම රු. |
|---|---|---|---|---|
| 01. | | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය | | 14,169,837 |
| | I. | කාර්යාල පද්ධතිය සකස් කිරීම | 2,000,000 | |
| | II. | කාර්ය මණ්ඩලය සඳහා වැසිකිළි පද්ධතිය සකස් කිරීම | 1,094,490 | |
| | III. | ආයතනයේ දොර ජනෙල් අළුත් වැඩියා කිරීම | 88,550 | |
| | II. | උපස්ථායක නිල නිවසේ සිවිලිම සකස් කිරීම | 241,000 | |
| 02. | | පුවක්පිටිය ජයවිරු සෙවන | | |
| | I. | ප්‍රධාන ශ්‍රවණාගාරය නවීකරණය කිරීම | 1,915,148 | |
| | II. | ස්ථානභාර නිලධාරිගේ නිල නිවස නවීකරණය කිරීම | 798,686 | |
| 03. | | කැටවල | | |
| | I. | කාර්යාල පද්ධතිය සකස් කිරීම | 1,825,000 | |
| | II. | ගබඩා කාමරය , කාර්යාලය හා වැසිකිළි පද්ධතිය සකස් කිරීම | 1,220,000 | |
| 04. | | සීදූව ආයතනය | | |
| | I. | දිරිය පොළ නවීරණය කිරීම | 1,900,000 | |
| | II. | ආයතනික සැලැස්මට අනුව E දරණ පාවහන් හා සම් භාණ්ඩ අංශයේ ගොඩනැගිලි ඉදිකිරීම් | 3,345,000 | |
| | III. | පිරිමි නේවාසිකාගාරයට අදාලව වැසිකිළි පද්ධතියක් ඉදිකිරීම | | |
| 05. | | මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. | වැසිකිළියක් සකස් කිරීම | 209,402 | |
| | II. | ජලනළ ක්‍රමයක් සකස් කිරීම | 68,691 | |
| | III. | නානකාමරය සකස් කිරීම | 776,686 | |
| | IV. | නේවාසිකාගාරයේ ග්‍රිල් වැඩ ඉදි කිරීම | 85,706 | |
| 06. | | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. | පරණ ගොඩනැගිල්ලේ සිට නව ගොඩනැගිල්ලට ප්‍රවේශ පහසුකම් සකස් කිරීම | 2,270,259 | |
| 07. | | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. | මිදුලට කොන්ක්‍රීට් ගඩොල් ඇතිරීම | 1,509,728 | |
| 08. | | කලවාන වෘත්තීය පුහුණු ආයතනය | | |
| | I. | මුළුතැන්ගෙය ඉදිරි පස කාණු පද්ධතිය සකස් කිරීම | 88,382 | |
| | II. | පිවිසුම් දොරටුව අසල බැම්ම හා වැට සකස් කිරීම | 81,663 | |

# 2 වන පරිච්ඡේදය

## ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධනය හා සංවර්ධන වැඩසටහන

- ❖ ආබාධ සහිත තරුණ තරුණියන් පුනරුත්ථාපනය කිරීම, වෘත්තීය පුහුණුව ලබා දීම, සමාජගත කිරීම හා රැකවරණය ලබා දීම.
- ❖ භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා ඇති පිරිමි ළමුන් සඳහා රැකවරණය සැපයීම
- ❖ මුල් ළමාවියේ දීම ඇතිවන ආබාධිත තත්ත්වයන් හඳුනාගෙන අවශ්‍ය මැදිහත් වීම හා සංවර්ධනය කිරීම.
- ❖ ආබාධ සහිත පුද්ගලයින් සඳහා වූ ප්‍රජාමූලික අන්තර්කරණ සංවර්ධන ජාතික වැඩසටහන
- ❖ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

### ➢ ව්‍යාපෘතිය - අංක 01

**ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම, පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීම.**

**i. හැඳින්වීම**

ආබාධිත ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන ප්‍රධාන ව්‍යාපෘතියකි , ආබාධ සහිත තරුණ තරුණියන්ගේ වෘත්තීමය හැකියාවන් බලගැන්වීම. ආබාධිත තරුණ තරුණියන්ගේ වෘත්තීමය ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම, සාර්ථකව පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන් සඳහා විධිමත් සහතිකයක් ලබා දීම හා සමාජ ගත කිරීම ද සිදුකෙරේ.

වයස අවු. 16 – 35 ක් අතර කිසියම් පුහුණුවකට සුදුසුකම් ඇති ආබාධ සහිත තරුණ තරුණියන් සම්මුඛ පරීක්ෂණයකින් පසු පහත සඳහන් පුහුණු පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම සිදු කරනු ඇත. ඇතුළත් කරගන්නා අභ්‍යාසලාභීන් සඳහා වසරක හෝ වසර දෙකක හෝ විධිමත් පුහුණුවක් ලබා දෙනු ඇත. පාඨමාලාව අනුව පුහුණු කාලය වෙනස් වේ. ඒ ඒ අභ්‍යාසලාභීන්ගේ හැකියාවන් අනුව පාඨමාලා හැදෑරීම සිදු වේ. පහත සඳහන් ආයතන 08 තුළ පාඨමාලා 24ක් පවත්වාගෙන යනු ලැබේ. පුහුණු කාලය තුළ නේවාසික පහසුකම්, ආහාර පාන, දෛනික දිමනා හා වෛද්‍ය පහසුකම් නොමිලයේ සැපයේ. පුහුණු පාඨමාලාවලට පරිභාහිරව ඔවුගේ ක්‍රීඩා හා සෞන්දර්යාත්මක හැකියා සංවර්ධනය කිරිම හා ජාතික මට්ටමේ තරගවලට යොමු කිරීම සිදුකෙරේ. මෙම අරමුණ පෙර දැරිව 2017 වර්ෂයේ කරන ලද වැඩසටහන් තුළ සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි විය.

වෘත්තීය පුහුණු ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා


01. ගුවන්විදුලි යන්ත්‍ර , රූපවාහිනි යන්ත්‍ර සහ ආශ්‍රිත උපකරණ කාර්මික ශිල්පය
02. ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පය
03. වඩු කාර්මික හා ලී කැටයම් ශිල්පය
04. මහන යන්ත්‍ර ක්‍රියා කරවීම (කර්මාන්ත ශාලා)
05. හස්ත කර්මාන්ත ශිල්පය (උණ ගස් ආශ්‍රිත සහ පොල් ආශ්‍රිත)
06. හස්ත කර්මාන්ත ශිල්පය ( කොසු සහ ඉදල් )
07. හස්ත කර්මාන්ත ශිල්පය ( වේවැල් හා කොහු)
08. හස්ත කර්මාන්ත ශිල්පය (විසිතුරු )
09. ඇඳුම් මැසීමේ ශිල්පය
10. ටේලරින් ශිල්පය
11. සම්බාහන චිකිත්සාව (නිල තෙරපුම)
12. පෙදරේරු කාර්මික ශිල්පය
13. මෝටර් රථ කාර්මික ශීල්පය
14. යන්ත්‍ර ශිල්පය
15. විදුලි ශිල්පය
16. මෝටර් රථ පින්තාරු ශිල්පය
17. පෑස්සුම් ශිල්පය
18. සිමෙන්ති නිෂ්පාදන ශිල්පය
19. පාවහන් හා සම් කාර්මාන්ත ශිල්පය
20. බතික් නිර්මාණ ශිල්පය
21. බේකරි හා ආහාර තාක්ෂණ ශිල්පය
22. ගෙවතු වගාව හා කෘෂිකාර්මික ශිල්පය
23. පේෂ කර්ම ශිල්පය
24. පරිඝණක ශිල්පය
25. ත්‍රීරෝද රථ කාර්මික ශිල්පය

**ii. ක්‍රියාකාරකම් -**

- ආබාධ සහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම.
- විධිමත් පරිදි පුහුණුව නිම කළ අභ්‍යාසලාභීන් සඳහා සහතික පත් ලබා දීම හා ,සමාජ ගත කිරීම.
- පුහුණුව නිමකළ අභ්‍යාසලාභීන් සඳහා මෙවලම් කට්ටල ලබා දීම විවෘත අංශයේ රැකියා සඳහා යොමු කිරීම.

**iii.** ස්ථානය - දිවයිනේ දිස්ත්‍රික් 08 ක මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වා ගෙන යනු ලබන
වෘත්තීය පුහුණු ආයතන




2017 වර්ෂයේ වෘත්තීය පුහුණු ආයතන අනුව අභ්‍යාසලාභීන් ගණන

| අනු අංකය | ආයතනය | 2017 අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | සීදූව වෘත්තීය පුහුණු ආයතනය | 94 |
| 02. | කැටවල වෘත්තීය පුහුණු ආයතනය | 33 |
| 03. | වත්තේගම වෘත්තීය පුහුණු ආයතනය | 93 |
| 04. | තෙළඹුයාය වෘත්තීය පුහුණු ආයතනය | 59 |
| 05. | අමුණුකුඹුර වෘත්තීය පුහුණු ආයතනය | 56 |
| 06. | කලවාන වෘත්තීය පුහුණු ආයතනය | 25 |
| 07. | මාදම්පේ වෘත්තීය පුහුණු ආයතනය | 26 |
| 08. | රාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 26 |
| | එකතුව | **412** |

2017 සමාජ සේවා දෙපාර්තමේන්තුව මගින් ස්වේච්ඡා ආයතනවල පුහුණුව ලබන අභ්‍යාසලාභීන් සඳහා දීමනා

| අනු අංකය | ආයතනය | 2017 අභ්‍යාසලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | ආබාධිත පුද්ගල සංවර්ධන පදනම - බණ්ඩාරවෙල | 31 |
| 02. | ඉස්ලාමීය ආබාධිත ආයතනය- තිහාරිය | 22 |
| 03. | සී/ස සර්වෝදය සුවසෙත ආයතනය | 17 |
| 04. | බටුගම්මන වෘත්තීය පුහුණු ආයතනය -බලංගොඩ | 22 |
| 05. | සුබිත වෘත්තීය පුහුණු ආයතනය - හොරණ | 10 |
| 06. | තලාව ආබාධ සහිත කාන්තා සංගමය - පහළගම පාර,තලාව | 06 |
| 07. | සවිය සංවර්ධන පදනම - වේවැල්ල පාර, ගාල්ල | 11 |
| 08. | ජාතික මානසික සෞඛ්‍ය සභාව 96/20, කිතුල්වත්ත පාර, කොළඹ | 19 |
| | එකතුව | 138 |

### iv. ප්‍රතිඵලය /වියදම - 2017/12/31 දිනට

**(ආබාධ සහිත වූවන් සඳහා වන සුභසාධන හා සංවර්ධන වැඩසටහනේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය - 1501)**

| අනු අංකය | ක්‍රියාකාරකම | ප්‍රතිපාදන රු.මිලියන | වියදම රු.මිලියන |
|---|---|---|---|
| 01. | වෘත්තීය පුහුණු ආයතනවල ආබාධ සහිත තරුණ තරුණියන් 412ක් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීම . | 50.300 | |
| | I. පුහුණු අභ්‍යාසලාභීන් සඳහා දීමනා<br>II. අමු ද්‍රව්‍ය<br>III. වෙනත් සුභසාධන වියදම්<br>IV. උපදේශක පුහුණු දීමනා<br>V. අධ්‍යාපන චාරිකා | | |
| | දෙපාර්තමේන්තුවේ මූල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා වෘත්තීය පුහුණු ආයතන 08 ක අභ්‍යාසලාභීන් 138ක් සඳහා දීමනා ගෙවීම. | | |
| | i. සුබිත කාන්තා වෘත්තීය පුහුණු ආයතනය- පාදුක්ක පාර , හොරණ<br>ii. ජාතික මානසික සෞඛ්‍ය සභාව- 96/20,කිතුල්වත්ත පාර , කොළඹ<br>iii. බටුගම්මන වෘත්තීය පුහුණු ආයතනය - බටුගම්මන, බලංගොඩ.<br>iv. ආබාධ සහිත කාන්තාවන්ගේ සංගමය - පහළගම පාර , තලාව<br>v. සී/ස සර්වෝදය සුවසෙත සේවා සමිතිය -<br>vi. සවිය සංවර්ධන පදනම - වේවැල්ල පාර, ගාල්ල<br>vii. ආබාධිත පුද්ගල සංවර්ධන පදනම ,පෙරේරා මාවත, බණ්ඩාරවෙල<br>viii. ඉස්ලාමීය ආබාධිත පුද්ගලයින්ගේ වෘත්තීය පුහුණු ආයතනය - දූල්මල , තිහාරිය | | |
| 02. | විධිමත් පරිදි පුහුණුව අවසන් කරන ලද අභ්‍යාසලාභීන් සඳහා මෙවලම් ලබාදීම. | 5.500 | |
| | i. රු. 15000/- ක් වටිනා මෙවලම් කට්ටල අභ්‍යාසලාභීන් 99ක් සඳහා ලබාදීම.<br>ii. මහන මැෂින් අභ්‍යාසලාභීන් 52ක් සඳහා ලබාදීම. | | |
| 03. | ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය - නාවින්න ,මහරගම | 1.500 | |
| | I. සේවාලාභී දරුවන් සඳහා පැමිණීමේ දීමනා<br>II. සංග්‍රහ වියදම්<br>III. චිකිත්සකවරුන් දෙදෙනෙකු සඳහා දීමනා (කථන චිකිත්සක/ භෞත චිකිත්සක / වෘත්තීය චිකිත්සක ) | | 42.770 |
| 04. | දෙපාර්තමේන්තුව යටතේ මූල්‍ය අනුග්‍රහ ලබන ස්වේච්ඡා සංවිධානවල නඩත්තු හා යථායෝග්‍යාධර ලබාදීම. | 0.100 | |
| | I. බිහිරි සේවා මණ්ඩලය<br>II. සර්වදාන පදනම | | |
| 05. | බුද්ධි ඌණතා ළමුන්හට අධ්‍යාපනය ලබා දෙන පෙර පාසල් ගුරුවරුන් 10ක් සඳහා දීමනා ලබාදීම. | 0.600 | |
| | I. වීරකැටිය අරුණැල්ල විශේෂ පාසැල- ගුරුවරුන් 02ක්<br>II. හ/ කටුවන ප්‍රාථමික විද්‍යාලය - ගුරුවරුන් 01ක්<br>III. හ/ රිටිගහයාය මහා විද්‍යාලය - ගුරුවරුන් 01ක්<br>IV. බඩල්කුඹුර ලිට්ල් ෆ්ලවර්ස් ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය - ගුරුවරු 03ක්<br>V. නුවරඑළිය වොල්ට්‍රීම් කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය - ගුරුවරු 03ක් | | |
| 06. | නිල ඇඳුම් , ටී - ෂර්ට් , බොටම් ,කැප්, සපත්තු, මේස් ,මෙට්ට,මදුරු දැල් | 5.900 | |
| 07. | කුසලතා සංවර්ධන මධ්‍යස්ථානවල නඩත්තු ආධාර | 1.100 | |
| | I. පානදුර - මාලමුල්ල ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය<br>II. බඩල්කුඹුර- ලිට්ල් ෆ්ලවර්ස් ළමා කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය<br>III. නුවරඑළිය- වොල්ට්‍රීම් කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය | | |
| 08. | ශ්‍රව්‍යාබාධිත වූවන් සඳහා හැඳුනුම් පත් ලබා දීම. | | |
| 09. | ශ්‍රව්‍යාබාධිතයන් සඳහා සංඥා භාෂා පරිවර්තනය ලබා දීම. | | |
| | එකතුව | 65.000 | |

## ➢ ව්‍යාපෘතිය - අංක. 02

### ළමා මාර්ගෝපදේශන වැඩසටහන

#### i. හැඳින්වීම

ළමයෙකුගේ මුල් ළමාවියේ දී වර්ධනයේ කිසියම් වෙනසක් හෝ ප්‍රමාදයක් හෝ ඇති බවට සැක සහිත අවස්ථාවක ඒ සඳහා කල් ඇතිව මැදිහත් වී දරුවා සංවර්ධනය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය මෙම වැඩසටහන මගින් ලබා දීම සිදුකෙරේ. නිවැරැදි මාර්ගෝපදේශයක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් ආයතනයට පැමිණෙන දෙමාපියන් සඳහා ප්‍රධාන වශයෙන්ම සිදුකෙරෙනුයේ දරුවාගේ ජීවන තොරතුරු ලබාගෙන දරුවා ලියාපදිංචි කර, දරුවන්ගේ අවශ්‍යතා හඳුනාගෙන වර්ධන තත්ත්වයේ නිවැරැදි තක්සේරුවක් ගැනීමයි. විස්තරාත්මක තත්ත්ව වාර්තාවක් සැලසීමෙන් අනතුරුව ගුරුවරුන් දෙමාපියන් සමග සාකච්ඡා කර දරුවන්ගේ කුසලතාවයන් අනුව සුදුසු පන්ති කාමරයකට යොමු කිරීම සිදුකෙරේ. මෙම දරුවන්ගේ වර්ධන තත්ත්වයන් හා කුසලතාවන් පිළිබඳ වාර්තා මාස හයට අවුරුද්දට සකස් කරන අතර තවදුරටත් සේවා ලබා ගැනීමට අවශ්‍යනම් දිගුකාලීනව පසුහාර කටයුතු සිදුකෙරේ.

- 2017 වර්ෂයේ ලියාදිංචි වූ නවක ළමුන් සංඛ්‍යාව - 70
- 2017 වර්ෂයේ සේවා ලබාදුන් සමස්ථ ළමුන් සංඛ්‍යාව - 175
- පෙර පාසල් වලට යොමු කළ ළමුන් සංඛ්‍යාව - 16
- පාසල්වලට යොමු කළ ළමුන් සංඛ්‍යාව - 14

2017 වර්ෂයේ ලියාපදිංචි ළමුන් වයස් මට්ටම් අනුව

| අනු අංකය | වයස අවු. | සංඛ්‍යාව |
|---|---|---|
| I. | 0-3 | 26 |
| II. | 4-5 | 26 |
| III. | 6-15 | 17 |
| IV. | 16ට වැඩි | 01 |
| | මුළු එකතුව | 70 |

එක් එක් අංශ මගින් ලබාදුන් සේවා විස්තර

| අනු අංකය | ලබා දුන් සේවය | ළමුන් සංඛ්‍යාව | සේවා වාර ගණන |
|---|---|---|---|
| I. | භෞතික චිකිත්සක ප්‍රතිකාර | 130 | 542 |
| II. | කථන චිකිත්සක ප්‍රතිකාර | 136 | 767 |
| III. | වෘත්තීය චිකිත්සක ප්‍රතිකාර | 120 | 314 |
| IV. | අධ්‍යාපන අංශය | 150 | 7192 |

2017 වර්ෂයේ ලියාපදිංචි වූ ළමුන් ආබාධ මට්ටම් අනුව

| අනු අංකය | ආබාධයේ ස්වභාවය | ළමුන් සංඛ්‍යාව |
|---|---|---|
| I. | ඔටිසම් (Autism ) | 13 |
| II. | මස්තිෂ්ක ආඝාතය (Cerebral Palsy ) | 04 |
| III. | ඩවුන් සින්රෝම් (Down Syndrome ) | 12 |
| IV. | වර්ධනය අඩුබව (Global Development delay) | 17 |
| V. | කථන හා භාෂා ගැටළු (Speech Delay) | 10 |
| VI. | අධික්‍රියාකාරී (Hyperactive) | 04 |
| VII. | වෙනත් | 10 |
| | එකතුව | 70 |

ළමුන් යොමු වූ ආකාරය අනුව

| අනු අංකය | යොමු වූ ආකාරය | සංඛ්‍යාව |
|---|---|---|
| | රිජ්වේ ආර්යා ළමා රෝහල මගින් | 11 |
| | සේවාලාභී දෙමාපියන් මගින් | 31 |
| | පෙර පාසල් ගුරුවරුන් මගින් | 09 |
| | පාසල්,අධ්‍යාපන ආයතන, රාජ්‍ය ආයතන මගින් | 06 |
| | විවිධ මාධ්‍ය හා අන්තර්ජාලය මගින් | 03 |
| | ප්‍රාදේශීය ලේකම් කාර්යාල - ක්ෂේත්‍ර නිලධාරීන් මගින් | 10 |

**ii.** ක්‍රියාකාරකම්

- ළමා ආබාධ කල් ඇතිව හඳුනාගෙන ඒ සඳහා මැදිහත්වීමේ වඩාත් ඵලදායී ක්‍රමවේදයන් හඳුන්වා දීම.
- ආබාධ සහිත දරුවන්ට සේවා සැපයීම සම්බන්ධව විවිධ ක්ෂේත්‍රවලට අදාළ සේවා ජාලය ශක්තිමත් කිරීම
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ මුල් ළමාවිය හා අන්තර්කරණ අධ්‍යාපනය ශක්තිමත් කිරීම.
- දෙමාපියන්ගේ හා පවුලේ සාමාජිකයන්ගේ මානසික තත්වය වඩාත් යහපත් තත්වයට ගෙන එම සඳහා උපදේශන සේවා පවත්වාගෙන යාම.
- ව්‍යාපෘතිය වෙනත් දිස්ත්‍රික්කවලට ව්‍යාප්ත කිරීම.

**iii.** ස්ථානය - පතිරගොඩ, වෙල පාර, නාවින්න - මහරගම ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානය

**iv.** ඉලක්ක කණ්ඩායම - වයස අවු. 0 – 18 දක්වා

**v.** ප්‍රතිඵලය - විශේෂ අවශ්‍යතා ඇති ළමුන් 70ක් සඳහා අවශ්‍ය සේවා ලබාදීම

## ➢ ව්‍යාපෘතිය - අංක.03

**දෙමාපියන් සහ භාරකරුවන් අහිමි බුද්ධි ඌණතා පිරිමි ළමුන් සඳහා රැකවරණවරය ලබා දීම.**

i. හැඳින්වීම -

දෙමාපියන් සහ භාරකරුවන් අහිමි විවිධ වයස් මට්ටම් ඇති බුද්ධි ඌණතා පිරිමි ළමුන්ට රැකවරණය ලබා දීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුකෙරේ. මුළු ජීවිත කාලයම නේවාසිකව සිටින මෙම ළමුන් හුදකලා නොකොට ආදරයෙන් සෙනෙහසින් රැකබලා ගන්නා අතරම දෛනික ක්‍රියාකාරකම් සඳහා යොමු කෙරේ. නේවාසික පහසුකම් ඇතුළුව ආහාර පාන හා වෛද්‍ය පහසුකම් නොමිලයේ ලබාදීම සිදුකෙරේ.

ii. ක්‍රියාකාරකම්

- බුද්ධි ඌණතා ඇති ළමුන් 100 ක් සඳහා රැකවරණය සැපයීම.
- ඔවුන් නිසා පවුල්වල සාමාජිකයින් අතර ඇතිවන කායික හා මානසික ගැටළු අවම කිරීම.
- පවුලේ සෙසු සාමාජිකයින්ගේ ආර්ථික, අධ්‍යාපන හා සංස්කෘතික දියුණුව සඳහා මැදිහත් වීම.

iii. ස්ථානය - අවිස්සාවේල්ල, පුවක්පිටිය , නොර්ත් අම්බලන්වත්ත, ජයවිරු සෙවන (රැකවරණ මධ්‍යස්ථානය )

iv. ඉලක්ක කණ්ඩායම - බුද්ධි ඌණතා සහිත පිරිමි ළමුන්

v. ප්‍රතිඵල - බුද්ධි ඌණතා ළමුන් 76 ක් සඳහා රැකවරණය ලබාදීම

## ➢ ව්‍යාපෘතිය - අංක. 04

**ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩ සටහන (සී. බී. ආර්.)**

i. හැඳින්වීම

ආබාධ සහිත පුද්ගලයින්ගේ ජාතික ප්‍රතිපත්තියට අනුව ,ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරමින් වගකීම් හා යුතුකම් ඉටු කිරීමට හැකිවනු පිණිස ඔවුන් දැනුමෙන් හා කුසලතාවලින් සවිබලගැන්වීම ප්‍රධාන වශයෙන්ම සිදුකෙරේ. එසේම එම ප්‍රජාවගේ පවුල්වල සාමාජිකයින්ගේ ආර්ථික හා සාමාජික යහපැවැත්ම තහවුරු කිරීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

ii. ක්‍රියාකාරම්

- ආබාධ සහිත වූවන් සඳහා සෘජු ප්‍රතිපාදන ලබා දීම හා පසුහාර කටයුතු සිදු කිරීම
- (කොමඩ්, ජලය, විදුලි බල පහසුකම් හා ප්‍රවේශ පහසුකම් ලබා දීම.
- ප්‍රාදේශීය මට්ටමින් ආබාධ සහිත පුද්ගලයන්ගේ ස්වශක්ති සංවිධාන පිහිටුවීම හා බලගැන්වීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන වෙනත් සංවිධාන සමග ඒකාබද්ධවී සේවා අවශ්‍යතා ලබා ගැනීමට පහසුකම් ඇති කිරීම.

- ආබාධිත ළමුන් සඳහා පවත්වාගෙන යනු ලබන කුසලතා සංවර්ධන මධ්‍යස්ථාන සඳහා යටිතල පහසුකම් සැපයීම.

iii. ස්ථානය - දිවයිනේ දිස්ත්‍රික්ක 25ක මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.
iv. ඉලක්ක කණ්ඩායම - දිවයිනේ ජීවත්වන සියලුම ආබාධිත ප්‍රජාව
v. ප්‍රතිඵලය හා වියදම -

ප්‍රජාමූලික පුනරුත්ථාපන වැඩසටහන - 2017 මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| 2-3-5-2509 වැය ශීර්ෂය | වැඩසටහන | සංඛ්‍යාව | ඇස්තමේන්තුව රු. මි. | වියදම රු. මි. |
|---|---|---|---|---|
| | 01. ආබාධිත ප්‍රජාව වෙනුවෙන් සපයන ලද සේවා | | 12.250 | 12.063 |
| | I. කොමඩ | 213 | | |
| | II. ජල මෙට්ට | 32 | | |
| | III. වායු මෙට්ට | 25 | | |
| | IV. ප්‍රවේශ පහසුකම් | 12 | | |
| | V. විදුලි පහසුකම් | | | |
| | VI. ජල පහසුකම් | 12 | | |
| | VII. වෙනත් | 64 | | |
| | 02. බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ව්‍යාප්තව ඇති සියලුම ස්වශක්ති සංවිධාන ඇගයීම | සංවිධාන 331ක් | | |
| | 03. රෝහල්වලට අනුයුක්ත කරන ලද ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වූ පුහුණු වැඩසටහන | වැඩසටහන් 02ක් | | |
| | 04. සී.බී.ආර්. අත්පොත | පිටපත් 750ක් | | |
| | 05. වෘත්තීය පුහුණු ආයතනවල පුහුණු පාඨමාලා පිළිබඳව ආබාධිත ප්‍රජාව දැනුවත් කිරීම. | වැඩසටහන් 12ක් | | |
| | 06. සී.බී.ආර්. සම්පත් මධ්‍යස්ථානය පිහිටුවීම - අමුණුකුඹුර | | | |
| | 07. විශේෂ ප්‍රගති සමාලෝචන රැස්වීම් හා ක්ෂේත්‍ර පරීක්ෂණ | රැස්වීම 20 ක් | | |

## ➢ ව්‍යාපෘතිය - අංක 05

### දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල

**i. හැඳින්වීම**

දෘශ්‍යාබාධිත තත්වයට පත්වන පුද්ගලයන්ට අවශ්‍ය සේවා සැපයීම ,පුනරුත්ථාපනය කිරීම හා සහන ලබාදීම මෙම අරමුදලේ මෙහෙවර වේ. ශ්‍රී ලංකාව තුළ ආබාධිත සහිත පුද්ගලයන් පිළිබඳ නව ආකල්ප වර්ධනය ක්‍රමයෙන් ආරම්භ වූයේ 1981 වර්ෂය ජාත්‍යන්තර ආබාධිත වර්ෂය ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමඟය. ඒ අනුව යමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් 1992 අංක 09 දරණ දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල නමින් පනතක් සම්මත කර රජයේ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කොට ඇත. මෙම පනතට සමගාමීව ශ්‍රී ලංකාවේ වෙසෙන දෘශ්‍යාබාධිත පුද්ගලයන් වෙනුවෙන් විවිධ සේවාවන් ආරම්භ කර ඇත.

**ii. ක්‍රියාකාරකම්**

- ස්වයං රැකියා කරගෙන යාම සඳහා ආධාර සැපයීම.
- ක්‍රීඩා කටයුතු පවත්වාගෙන යාම හා වැඩිදියුණු කිරීමට ආධාර සැපයීම.
- අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතු සඳහා ආධාර සැපයීම.
- දෘශ්‍යාබාධිත විශ්වවිද්‍යාල සිසුන්ට ශිෂ්‍යාධාර ලබාදීම.
- උසස් පෙළ හදාරන දෘශ්‍යාබාධිත සිසුන් සඳහා මුදල් ආධාර සැපයීම.
- අඩු ආදායම්ලාභීන්ට නොමිලයේ අක්ෂිකාච ලබා දීම.
- සුභසාධන කටයුතු පවත්වාගෙන යාම.
- දෘශ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
- පරිපාලන කටයුතු පවත්වාගෙන යාම.
- විභාග ගාස්තු ගෙවීම.
- අවශ්‍යතා මත අරමුදලේ පරමාර්ථයන් ඉටු කිරීම සඳහා විවිධ වියදම් දැරීම.
- චලතාවය හා දිසානතිය පුහුණු ලබාදීම සඳහා උපදේශන දීමනා ගෙවීම.

iii. ස්ථානය - සමාජ සේවා දෙපාර්තමේන්තුව

iv. ඉලක්ක කණ්ඩායම - දෘශ්‍යාබාධිත පුද්ගලයින්

v. ආරම්භ කළ දිනය - 1992

vi. ප්‍රතිඵලය හා වියදම -

දෘශ්‍යාබාධිත පුනරුත්ථාපන භාර අරමුදල - මූල්‍ය ප්‍රගතිය 2017

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිලාභීන් | ඇස්තමේන්තුව රු. මි. | වියදම රු. මි. |
|---|---|---|---|---|
| 01. | ක්‍රීඩා ආධාර - | | 0.200 | 0.190 |
| | I. දෘශ්‍යාබාධිත ආසියාතික චෙස් තරඟයට සහභාගි වූ දෘශ්‍යාබාධිතයින් 03ක්සඳහා ගෙවීම් කිරීම.<br>II. දෘශ්‍යාබාධිත ක්‍රිකට් කණ්ඩායම ඇගයීම් වෙනුවෙන් සුදු සැරයටි සැමරුම් උත්සවයේ දී එම ක්‍රිකට් කණ්ඩායම සඳහා ත්‍යාග ලබාදීම. | 03<br>20 | | |
| 02. | වෘත්තීය පුහුණු - | | 0.200 | 0.290 |
| | I. සීදූව වෘත්තීය පුහුණු ආයතනයේ සංගීත ගුරු උපදේශක වන්දන සම්පත් මහතාට ගුරු දීමනා ගෙවීම. | 01 | | |
| | II. සීදූව වෘත්තීය පුහුණු ආයතනයේ චෙස් ක්‍රීඩා උපදේශක සංජීව කරුණාරත්න මහතාට දීමනා ගෙවීම. | 01 | | |
| | III. බලංගොඩ බටුගම්මන රියන්සි අලගිය වන්න ආබාධිත වෘත්තීය පුහුණු ආයතනයේ කොහු උපදේශක ඩී. උපුල් ශාන්ත මහතාට ගෙවීම් කිරීම. | 01 | | |
| | IV. රත්මලාන අන්ධ විද්‍යාලයේ සේවා පුහුණු ව්‍යාපෘතිය සඳහා සඳුනි පබසරා මෙනවිය සඳහා ගෙවීම් කිරීම. | 01 | | |
| | V. ශ්‍රී ලංකා දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනයේ දුර කථන ක්‍රියාකරු කේ.එල්. තිළිණ ප්‍රසාද් මහතාට ගෙවීම් කිරීම. | 01 | | |
| | VI. ශ්‍රී ලංකා අන්ධජන සේවා මණ්ඩලයේ පරිඝණක හා දුරකථන ක්‍රියාකරු රුවනි දේවිකා මෙනවිය සඳහා ගෙවීම. | 01 | | |
| 03. | අධ්‍යාපන හා සංස්කෘතික ආධාර | | 3.500 | 3.700 |
| | I. විශ්ව විද්‍යාල සිසුන් සඳහා රු. 1000.00 ක මාසික දීමනාවක් ගෙවීම. | 90 | | |
| | II. උසස් පෙළ සිසුන් සඳහා රු. 2000.00 මාසික දීමනාවක් ගෙවීම. | 11 | | |
| | III. දෑස් නොපෙනෙන දෙමාපියන්ගේ දෑස් පෙනෙන දරුවන් සඳහා රු.500.00 ක මාසික දීමනාවක් ගෙවීම. | 254 | | |
| | IV. අන්ධ පුරවැසි පෙරමුණ බ්‍රේල් මධ්‍යස්ථානය මාසිකව නිකුත් කරන කාලය සඟරාව සඳහා මාසිකව රු. 13,500.00 ගෙවීම් කිරීම. | 01 | | |
| | V. බත්තරමුල්ල අපේ ගම පරිශ්‍රයේ දී සුදු සැරයටි සැමරුම් දින උත්සවයේ දී විශේෂ ඇගයීමට ලක් වූවන් සඳහා ත්‍යාග ලබාදීම (විසිල් කේතලයක් ) | 355 | | |
| | VI. පළමු වසර විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂකයින් සඳහා ES Daisy Recorder ලබාදීම. | 31 | | |
| | VII. 2016 උසස්පෙළ විශිෂ්ට ලෙස සමත් සිසුස් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම. | 05 | | |
| | VIII. දෘශ්‍යාබාධිත කලාකරුවන් සුදු සැරයටි උත්සවය සඳහා සහභාගි කරවීම | 06 | | |
| | IX. ශ්‍රී ලංකාවේ ඇති එකම දෘශ්‍යාබාධිත සංගීත කණ්ඩායම වන විෂන් සංගීත කණ්ඩායම සුදු සැරයටි උත්සවය සඳහා සහභාගි කරවාගෙන ඔවුන්ගේ සේවය ලබා ගැනීම. | 06 | | |

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිලාභීන් | ඇස්තමේන්තුව රු. මි. | වියදම රු. මි. |
|---|---|---|---|---|
| **04.** | පුනරුතථාපන ආධාර | | **0.420** | **1.300** |
| | I. අන්ධජන සේවා මණ්ලය - උපදේශකවරුන් / පුහුණු ලාභීන් | **07** | | |
| | II. දෘශ්‍යාබාධිත ජනතා සම්මේලනය - මහමීගස්සැගම දෘශ්‍යාබාධිත වෘත්තීය පුහුණු ආයතනයේ නේවාසිකාගාර අලුත් වැඩියා කටයුතු සඳහා ගෙවීම් කිරීම | **16** | | |
| **05.** | අක්ෂිකාච හා අක්ෂි ප්‍රතිකාර ලබාදීම. | | **0.800** | **0.170** |
| | දෘශ්‍යාබාධ සහිත පුද්ගලයින් | **17** | | |
| **06.** | දෘෂ්‍යාබාධිත කාන්තා සුභසාධන මධ්‍යස්ථානය | | **0.520** | **0.250** |
| | I. උපදේශක | **01** | | |
| | II. සහායිකා | **01** | | |
| | III. දෘශ්‍යාබාධිත සිසුන් | **05** | | |
| **07.** | පරිපාලන වියදම් | | **0.800** | **0.980** |
| **08.** | විගණන ගාස්තු | | **0.040** | **0.040** |
| **09.** | මුල්‍ය වියදම් | | **0.020** | **0.010** |
| **10.** | විවිධ | | **0.040** | **0.060** |
| **11.** | උත්සව අත්තිකාරම් | **01** | **0.010** | **0.010** |
| | එකතුව | | **7.000** | **7.000** |

# 3 වන පරිච්ඡේදය

## මතට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීම හා සමාජගත කිරීමේ ව්‍යාපෘතිය

### හැඳින්වීම

මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම, සමාජගත කිරීම හා වෘත්තීමය හැකියාවන් වැඩි දියුණු කිරීම මෙම වැඩසටහන මගින් සිදුකෙරේ. හෙරොයින්, ගංජා, කේරළ ගංජා, මද්‍යසාර හා මත්පෙති භාවිතය නිසා ජීවිතය අඳුරුකරගත් පිරිස් ආයතනගත කිරීම මූලිකව සිදුකෙරේ. ආයතනයට ඇතුළත්වීමෙන් පසු ප්‍රධාන වශයෙන්ම සිදුකෙරෙනුයේ මනෝචිකිත්සක, මනෝ විද්‍යාත්මක උපදේශන ක්‍රමවේදයන් හා වෛද්‍ය විද්‍යාත්මක ප්‍රවේශයන් ඔස්සේ පුනරුත්ථාපන ක්‍රියාවලියට යොමු කිරීමයි. එම කාලය තුළ අභ්‍යාසලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා යෝගී භාවනා හා ආගමික වැඩසටහන් පැවැත්වීම සිදු කෙරේ. අභ්‍යාසලාභීන් පුනරුත්ථාපනය වන කාලය තුළ නේවාසික පහසුකම් ආහාර පාන වෛද්‍ය පහසුකම් නොමිලයේ සැපයේ. අභ්‍යාසලාභීන්ගේ ජීවනෝපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන වෘත්තීමය හැකියාවන් සංවර්ධනය කිරීමේ පුහුණුවක්ද නේවාසික කාලය තුළ ලබා දෙනු ඇත. ආයතනගතව පුනරුත්ථාපනය කරන අතර ම දිවයිනේ තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාම සේවා වසම් හරහා පාසැල් සිසුන් දැනුවත් කිරීමේ හා පවුල් සංවර්ධන වැඩසටහන් සිදු කෙරේ.

මත්ද්‍රව්‍ය වර්ගය අනුව අභ්‍යාසලාභීන් ආයතනගත වීම.

| මත්ද්‍රව්‍ය වර්ගය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| හෙරොයින් | 234 | 63% |
| ගංජා/ කේරල ගංජා | 75 | 21.16% |
| මද්‍යසාර | 42 | 11.30% |
| මත්පෙති | 19 | 05.10% |
| වෙනත් / විවිධ | 02 | 00.53% |

### ක්‍රියාකාරකම්

I. මතට ඇබ්බැහි වූවන් පුනරුත්ථාපනය කිරීම ,වෘත්තීය හැකියාවන් වැඩි දියුණු කිරීම හා සමාජ ගත කිරීම.

II. මත් ඇබ්බැහි වීම නිසා ඔවුන්ගේ පවුල් පරිසරය තුළ හටගෙන ඇති ගැටළු අවම කිරීම සඳහා මැදිහත්වීම.

III. මත් ද්‍රව්‍ය භාවිතය නිසා බිඳවැටුණු රැකියාවන් හා අධ්‍යාපනය කටයුතු යථා තත්වයට ගෙන ඒම සඳහා අදාල පාර්ශවයන් සමග සම්බන්ධතා ගොඩනැගීම.

IV. අවදානම් කණ්ඩායම් සඳහා මත් ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

**ස්ථානය - අවිස්සාවේල්ල, පුවක්පිටිය, නොර්ත්අම්බලම්වත්ත, ජයවිරු සමාධි නිවහන**

**ඉලක්ක කණ්ඩායම - මතට ඇබ්බැහි වූවන් 100 ක් පුනරුත්ථාපනය සඳහා ඇතුළත් කර ගැනීම**

**ආරම්භ කළ දිනය - 2001 වර්ෂයේ**

**ප්‍රතිඵලය - අභ්‍යාසලාභීන් 102ක් පුනරුත්ථාපනය වී සමාජගත කර ඇත.**

| වැයශීර්ෂය 02-03-02-1501 | ක්‍රියාකාරකම | 2017 ප්‍රතිපාදන (රු.මි.) | 2017 වර්ෂයේ දෙසැම්බර් 31 වනදින දක්වා භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | මුල්‍ය ප්‍රගතිය (රු.මි.) | |
| | මත්නිවාරණ හා පුනරුත්ථාපන වැඩසටහන | 2.000 | 1.792 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 24ක තෝරාගත් ග්‍රාම නිලධාරීවසමක් පදනම් කරගෙන වැඩසටහන ක්‍රියාත්මක කිරීම. |
| | මතට ඇබ්බැහි වූවන් නේවාසිකව පුනරුත්ථාපනය කිරීම හා වෘත්තීය පුහුණුව ලබා දීම | - | - | පුනරුත්ථාපනය හා මත් නිවාරණය වූ සංඛ්‍යාව - 90 |

## 4 වන පරිච්ඡේදය

### 2016 වර්ෂයේ දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහන් හා පුහුණු පාඨමාලාවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| දේශීය පුහුණු වැඩසටහන | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණුව ලැබූ කාල සීමාව | ස්ථානය | ඇස්තමේන්තුව රු. මි. | වියදම රු.මි. |
|---|---|---|---|---|---|
| ප්‍රසම්පාදන හා කොන්ත්‍රාක් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමාව | ඩී.ටී.ඩී. එදිරිසිංහ මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක | වර්ෂයක් | මිලෝදා (Academy of Financial Studies) | 5.070 | 5.070 |
| බැහැරගත ක්‍රියාකාරකම් සහිත පුහුණු වැඩසටහන | දෙපාර්තමේන්තු නිලධාර්න් 100ක් | 2017/12/16 | මහනුවර දිගන “අපේක්ෂා නිවස” | | |
| උපදේශන ඩිප්ලෝමාව | එන්.ඩී.බී. මනෝරි මිය | පෙබරවාරි | ජාතික සංවර්ධන ආයතනය | | |
| සමාජ වැඩ ඩිප්ලෝමාව | ක්ශේත්‍ර නිලධාරින් 29ක් | වසර දෙකක් | ජාතික සමාජ සංවර්ධන ආයතනය | | |
| බැහැරගත පුහුණු වැඩසටහන | ත්‍රිකුණාමලය/ අනුරාධපුරය/ වවුනියාව අම්පාර/ මඩකලපුව කුරුණෑගල ක්ශේත්‍ර නිලධාරින් 50ක් | මාර්තු | දඹුල්ල ඉබ්බන්කටුව | | |
| බැහැරගත පුහුණු වැඩසටහන | ගම්පහ/හම්බන්තොට/ මොණරාගල/ කුරුණෑගල ක්ශේත්‍ර නිලධාරින් 50ක් | මාර්තු | දඹුල්ල ඉබ්බන්කටුව | | |
| ක්ශේත්‍ර නිලධාරීන්ගේ වාර්ෂික පුහුණු වැඩසටහන | රත්නපුර/ කුරුණෑගල/ අනුරාධපුර/ පුත්තලම ක්ශේත්‍ර නිලධාරීන් 61ක් | | | | |
| ක්ශේත්‍ර නිලධාරීන්ගේ වාර්ෂික පුහුණු වැඩසටහන | මාතර / කෑගල්ල/ ගාල්ල යන දිස්ත්‍රික්කවල ක්ශේත්‍ර නිලධාරීන් 61ක් | | | | |
| විදේශීය පුහුණු වැඩසටහන් | | | | | |

| දේශීය පුහුණු වැඩසටහන | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණුව ලැබූ කාල සීමාව | ස්ථානය | ඇස්තමේන්තුව රු. මි. | වියදම රු.මි. |
|---|---|---|---|---|---|
| ජයිකා පුහුණු වැඩසටහන | ශාමලී කරවිට මිය - සමාජ සේවා නිලධාරී | 2017/01/09 සිට 2017/03/04 | ජපානය | | |
| ජාත්‍යන්තර කළමණාකරණ වැඩසටහන | රංජිත් උදයසිරි මහතා - ප්‍රධාන ගණකාධිකාරි | 2017/01/22 සිට 2017/01/04 | ඉන්දුනීසියාව | | |
| උපායමාර්ගික කළමණාකරණය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව | ප්‍රදීප් යසරත්න මහතා - සමාජ සේවා අධ්‍යක්ෂ | 2017/02/28 සිට 2017/03/08 | ඕස්ට්‍රේලියාව | | |
| Second Country Study Visit (SLIDA)For SLAS Class 1 Officer | ප්‍රදීප් යසරත්න මහතා - සමාජ සේවා අධ්‍යක්ෂ | 2017/06/11 සිට 2017/06/17 | මැලේසියාව | | |
| Administrator and Decision Makers | ජේ. ආර් . දෙනවක මිය | 2017/08/27 සිට 2017/09/02 | තායිලන්තය | | |
| ජාත්‍යන්තර ආබාධිත ව්‍යවසායකයන් සඳහාවන සමුළුව | ප්‍රදීප් යසරත්න මහතා - සමාජ සේවා අධ්‍යක්ෂ | 2017/09/04 සිට 2017/09/09 | කොරියාව | | |
| ජෙනම් පුහුණු ව්‍යාපෘතිය කොරියාව | පත්මසිරි ගම්ලත් මහතා - සමාජ සේවා නිලධාරී<br>කුසුම් පද්මසිරි මහත්මිය - උදේශිකා<br>එඩ්මන් පීරිස් මහතා - උපදේශක<br>නලින්ද ධර්මසිරි මහතා - උපදේශක<br>ලයනල් රාජපක්ෂ මහතා - උපදේශක | 2017/10/23 | කොරියාව | | |
| Diploma in public Procurement and Contract Administration Academy of Finance Studies | ඩී.ටී.ඩී. එදිරිසිංහ මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක | 2017/11/14 සිට 2017/11/24 | එක්සත් රාජධානිය | | |
| | කේ. ජේ. ආර්. සමරවීර මයා - සමාජ සේවා නිලධාරි | 2017/11/27 සිට 2017/12/02 | චීනය | | |
| 16 වන ආසියා සුසුම්නා ජාල සමුළුව | ධම්මික ප්‍රියනන්ද මහතා - සමාජ සේවා නිලධාරි<br>පියන්ත ද සිල්වා මහතා සමාජ සේවා නිලධාරි | 2017/12/08 සිට 2017/12/10 | තායිලන්තය | | |

# 5 වන පරිච්ඡේදය

**2017 වර්ෂයේ කරන ලද විශේෂ වැඩසටහන් හා ජයග්‍රහණ**

- ආබාධ සහිත වූවන්ගේ ''ජාතික මලල ක්‍රීඩා උළෙල'' දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනයේ දී 2017 නොවැම්බර් 17 වනදින පවත්වන ලදි.

- ආබාධ සහිත වූවන්ගේ ''සිත් රූ 2017'' සංස්කෘතික කලා ප්‍රසංගය හා ස්ව ශක්ති කණ්ඩායම් ඇගැයීමේ ජාතික සම්මාන උළෙල නෙළුම්පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේ දී 2017 ඔක්තෝබර් 02 වන දින පවත්වන ලදි .

- ජාත්‍යන්තර සුදු සැරයටි දිනයට සමගාමීව සුදුසැරයටි දින සැමරුම් ජාතික උළෙල 2017 ඔක්තෝබර් 25 වන දින බත්තරමුල්ල ''අපේ ගම'' පරිශ්‍රයේ දි පවත ලදි.

- උතුරු පළාතේ ආබාධිත ළමුන්හට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2017 ඔක්තෝබර් 20 වන දින මුල්ගල් තැබීම සිදුවිය.

- නැගෙනහිර පළාතේ ආබාධිත ළමුන්හට වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා මඩකළපුව දිස්ත්‍රික්කයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2017 ඔක්තෝබර් 27 වන දින මුල්ගල් තැබීම සිදුවිය.

- කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම කොට්ඨාසයේ කොට්ටාව නගරයේ ළමා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2017ඔක්තෝබර් 09 වන දින මුල්ගල් තැබීම සිදුවිය.

- සමාජ සේවා දෙපාර්තමේන්තුවේ රෝහල්වලට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සත්‍ය සිද්ධීන් ඇසුරෙන් සැදුම් ලත් "විනිවිද" සිද්ධි අධ්‍යන ග්‍රන්ථය, "ප්‍රභාතය" අත් පොත එළිදැක්වීම හා ඵලදායිතා සම්මාන ප්‍රදානය කිරීමේ උළෙල 2017 පෙබරවාරි 02 වන දින සිදුවිය.

**Department of Social Services**
**2nd Floor**
**Stage II, Sethsiripaya,**
**Battaramulla.**

Telephone : 0112187050

Fax : 0112186276

Email : dirssdss@gmail.com
dirssdss@sltnet.lk

Web Site : www.socialservices.gov.lk

**සමාජ සේවා දෙපාර්තමේන්තුව**
**சமூக சேவைகள் திணைக்களம்**
**DEPARTMENT OF SOCIAL SERVICES**

Printed by - Vistart Advertising (Pvt) Ltd
(071 400 10 65)